# නාට්‍ය කලාව හා භාෂාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

***හේරත්, එච්. එම්. කේ.*** [1]

සෑම සාහිත්‍යාංගයක ම මුඛ්‍ය ලක්‍ෂණය වන්නේ බස භාවිතයෙන් යම් අනුභූතියක් ප්‍රතිනිර්මාණය කිරීමයි. නාට්‍ය නිර්මාණයක් බිහි වන්නේද භාෂාව මාධ්‍යය කොට ගෙනය. නාට්‍ය නිර්මාණයක් සම්පූර්ණ වීම සඳහා පිටපත් රචකයෙකු, අධ්‍යක්‍ෂවරයෙකු, නළු-නිළියන් හා අවශේෂ ශිල්පීන් රැසකගේ දායකත්වය වුවමනාය. එසේ වුවත් නාට්‍ය නිර්මාණයක මූලිකත්වය හිමි වන්නේ නාට්‍ය පිටපතටයි. නාට්‍ය අධ්‍යක්‍ෂවරයා සිය පරිකල්පන ශක්තිය උපයෝගී කර ගෙන නළු-නිළියන්ගේද සහභාගිත්වයෙන් විවරණය කරන්නේ එම නාට්‍ය පිටපතයි. එසේ හෙයින් අනෙක් සෑම සාහිත්‍යාංගයක සේම නාට්‍ය කලාවේද භාෂාවට වැදගත් ස්ථානයක් හිමි වෙයි. මෙමගින් සිදු වන්නේ නාට්‍ය කලාව හා භාෂාව අතර පවත්නා අවියෝජනීය සම්බන්ධතාව පිළිබඳ කරුණු විමර්ශනය කිරීමයි. නාට්‍යය ප්‍රධාන ශෛලීන් දෙකක් ඔස්සේ වේදිකාවට ප්‍රවේශ වෙයි. එනම්, ශෛලීගත හා ස්වභාවික යනුවෙනි. මෙම ශෛලීන් දෙක අනුව නිර්මාණයේ බස් වහර වෙනස් වෙයි. ශෛලීගත නාට්‍ය පිටපතක නිර්මාණාත්මක දෙබස් ගද්‍යයෙන් මෙන්ම පද්‍යයෙන්ද ඇතුළත්ය. එහෙත් එවැනි දෙබස් කෙසේ කෙබඳු අවස්ථාවලදී භාවිත කළ යුතුද යන්න අභියෝගාත්මකය. එවැනි දෙබස් භාවිතයෙන් නාට්‍යයේ සාර්ථක-අසාර්ථකභාවයද තීරණය වෙයි. ස්වභාවික නාට්‍ය පිටපතක් රචනා කිරීමේදී නාට්‍ය රචකයාට බස පිළිබඳ අභියෝගයකට මුහුණ දීමට සිදුවෙයි. ඔහු සතු ප්‍රධාන මෙවලම වන ගද්‍ය සංවාද අනුසාරයෙන් නාට්‍යයේ මුල-මැද-අග සම්බන්ධතාව පවත්වා ගෙන යාමට සුදුසු පරිදි බස පරිහරණය කළ යුතුය. ස්වභාවික නාට්‍යයක ජීවය රඳා පවතින්නේ සංවාදකරණයේ සාර්ථකත්වය මතය. සෙසු කලා මාධ්‍ය සමග සංසන්දනය කිරීමේදී නාට්‍ය කලාව සජීවී කලා මාධ්‍යයක් වන හෙයින් නාට්‍යකරුවා බස පරිහරණයේදී සැලකිලිමත් විය යුතුය. මේ පිළිබඳ ශෛලීගත මෙන් ම ස්වභාවික නාට්‍ය මූලාශ්‍රයද භාවිත කරමින් විධිමත්ව හා විමර්ශනාත්මකව කරුණු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

**ප්‍රමුඛ පද :** නාට්‍ය කලාව, භාෂාව, ප්‍රතිනිර්මාණය, පසුබිම, පරිකල්පනය

[1]*සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.* kusumherath7@yahoo.com